Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුර සඳහා පුරප්පාඩු පිරවීම (සීමිත බඳවා ගැනීම)

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පෙර පාසල් ගුරු තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් (සීමිත බඳවා ගැනීමට) පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට අතින්/ලියාපදිංචි තැපැල මගින් හෝ kmpsdev@gmail.com යන විද්‍යුත් තැපැලට 2020.12.18 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප්ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | පෙර පාසැල් ගුරු III ශ්‍රේණිය | 01 | MN-1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි).<br><br>පෙර පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසැල්ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපනය හා ළමා සංවර්ධන පිළිබඳ මාස 06ට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>පළපුරුද්ද : පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
2. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. දැනටමත් පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදළ නොවේ.
5. ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල මත පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
2. පත්වීම වසරක වැඩ පරීක්ෂක කාලයකට යටත් වේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කෙමිෂන් සභාවේ හෝ කෙටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) අධ්‍යාපන සහතිත
(3) අදාළ කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය.
(4) මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්
(5) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(6) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

02. *අයදුම්කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ( A4 ප්‍රමාණයේ) අයදුම්පත 2020.12.31 වැනි දිනට පෙර ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාදිංචි තැපෑලෙන්/අතින් හෝ kmpsdev@gmail.com යන විද්‍යුත් තැපැලට හෝ එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිව එවිය යුතුය.

(4) අදාළ දින ඉකුත් වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැළකිය යුතුයි.**- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
ගොතටුව මුල්ලේරියාව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................ තනතුර සඳහා අයදුම්පත*

(1) (අ) මුලකුරු සමග නම :...................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :...................................................................

(2) (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...................................................................

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :...................................................................

(3) දුරකථන අංකය : පෞද්ගලික :.............................. නිවස :..............................

(4) ස්ත්‍රී/පුරුෂ භාවය :..............................

(5) (අ) උපන් දිනය : වර්ෂය :..................... මාසය :..................... දිනය :.....................

(ආ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස :

අවුරුදු : [ ] මාස : [ ] දින : [ ]

(6) ජාතික හැඳුනුම්පත් අංකය :.......................................

(7) විවාහක/අවිවාහක තත්ත්වය :....................................

(8) අධ්‍යාපන සුදුසුකම් :

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :....................................

8.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :

I. වර්ෂය :........................ මාසය :........................
II. විභාග අංකය :........................
III. ප්‍රතිඵල :

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10 | | |

8.3 අ.පො. ස. (උසස් පෙළ) :

I. වර්ෂය :........................ මාසය :........................
II. විභාග අංකය :........................
III. ප්‍රතිඵල :

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

(9) වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :……………………………………………………………………………………
………………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………

වෙනත් සුදුසුකම් :………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………

(10) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද/ නැත්ද යන වග :…………………

(11) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර ෘ

අ. දැනට දරන තනතුර:…………………

ආ. එම තනතුරට පත් වූ දිනය:…………………

ඇ. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති යන වග):…………………

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්කරු වන ............................මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

…………………

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :…………………

පදවි නාමය:…………………

දෙපාර්තමේන්තුව/ආයතනය:…………………

(නිල මුද්‍රාව යොදන්න)

දිනය :…………………